# An investigative study on evanescence of 'Dhamma' in sautrātika tradition

## “ධර්ම” විෂයෙහි සෞත්‍රාන්තික සම්ප්‍රදායානුගත ක්ෂණිකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

Karapikkada Sobitha

ථේරවාදයෙන් බිඳීගිය බෞද්ධ සම්ප්‍රදායයක් වන සෞත්‍රාන්තික සම්ප්‍රදායට අයත්හු සූත්‍ර දේශනා පමණක් ප්‍රාමාණිකත්වයෙන් සැලකූ බැවින් සෞත්‍රාන්තික නාමයෙන් හඳුන්වා ඇත. '***කඃ සෞත්‍රාන්තිකාර්ථීඃ යෙ සූත්‍ර ප්‍රමාණතානතු ශාස්ත්‍ර ප්‍රමාණකාස්තෙ සෞත්‍රාන්තිකාඃ***' ඔවුහු ධර්ම විෂයෙහි නිරන්තර ක්ෂණිකත්වය දැක්වූහ. ඒ තුළ කිසිදු පැවැත්මක් අවධාරණය නොවේ. '***ක්ෂණිකානං නාස්ති දෙශාන්තර ගමනං යත්‍රෛවෝත්සත්තිඃ තත්‍රෛව විනාශඃ***' මේ අනුව ථේරවාදයේ මෙන්ම සර්වාස්තිවාදයේ දැක් වූ “ඨිති” “ස්ථිති” අවස්ථාවන් මෙහි අවධාරණය වී නොමැති බව පෙනේ. සෞත්‍රාන්තික සම්ප්‍රදායවාදීහු ධර්ම විග්‍රහය තුළ “උප්පාද” “භංග” යන අවස්ථාවන් පමණක් පෙන්වා දී ඇති අතර, මේ සඳහා ඔවුහු ආදි බෞද්ධ දේශනා තුළ දැක්වෙන්නා වූ ***'අනිච්චාවත සංඛාරා උප්පාද වය ධම්මිනො'*** ***'හෙතුං පටිච්ච සම්භූතා හෙතු භංගා නිරුජ්ඣති'*** ආදි දේශනාවන් මූලබීජ වශයෙන් ගෙන ඇත. උක්ත දේශනාවන් තුළ කිසිදු ආකාරයක ධර්ම විෂයෙහි පැවැත්මක් අවධාරණය නොවන බැවින් ඔවුහු 'උප්පාද' 'භංග' යන අවස්ථාවන් පමණක් අවධාරණය කළහ. ඒ තුළ ධර්ම හටගැනීමත් සමඟ එහි විනාශය ක්ෂණිකව සිදුවන බව දැක්වේ. මෙම ඉගැන්වීම තුළ සෞත්‍රාන්තිකයන් හමුවේ ඇති වූ මූලික ගැටලු දෙකක් පිළිබඳ නිකායාන්තර විග්‍රහයන් තුළ දැක්වේ. ක්ෂණික වූ ධර්මයන් විෂයෙහි ඉනන්ද්‍රියානුභූතියක් ගොඩනගන්නේ කෙසේ ද?, උපන් ක්ෂණය තුළම ධර්මයන් විනාෂ වේ නම්, හේතුඵල සම්බන්ධතාවයක් ගොඩනැගෙන්නේ කෙසේ ද, යනු එම ගැටලු දෙකයි. මෙම ගැටලු විෂයෙහි සෞත්‍රාන්තිකයන් ලබාදුන් පිළිතුරු වන්නේ ධර්ම විෂයෙහි පැවැත්මක් නොතිබුණ ද, අනුමානය තුළින් ධර්ම පිළිබඳ ඉන්ද්‍රියානුභූතිය ලබාගත හැකි බවයි. ධර්ම ඉපදීමත් විනාශයත් අතර වන්නා වූ ඡායාමාත්‍රය අනුමාන වශයෙන් ගෙන මානසික ප්‍රත්‍යවේක්ෂණය තුළින් ඒ පිළිබඳ අනුභූතියක් ලැබිය හැකි බව ඔවුන්ගේ මතතයි. එය “බාහ්‍යාර්ථානුමේයවාදය” ලෙසින් දැක්වේ. එසේ ම ඔවුන් හමුවේ වූ අනෙක් ගැටලුව විෂයෙහි සෞත්‍රාන්තික අදහස වනුයේ “අභූත්වාභාවෝත්පාදවාදය”යි. එනම් එනම් පෙර නොවූ ධර්මයක් අලුතෙන්ම හටගැනීම් වශයෙන් එකකට පසුව තවත් එකක් පැමිණීමේ ආකාරයෙන් අඛණ්ඩ පැවැත්මක් ක්‍රියාත්මක වන බවයි. මෙය ආදි බෞද්ධ හේතුඵල ධර්ම විග්‍රහය ඉක්මවීමක් ලෙස ද දැකගත හැකිය. එසේ ම පසුකාලීනව සෞත්‍රාන්තික සම්ප්‍රදායවාදීහු ස්ව ධර්ම විග්‍රහය සඳහා ආභිධම්මික කාරණා ද එකතු කොට ඇති ආකාරය දැකිය හැකිය. අපගේ මෙම විමර්ශනය තුළින් සෞත්‍රාන්තික ක්ෂණවාදය පිළිබඳ සමයාන්තර ඉගැන්වීම් හා තුළනාත්මකව අධ්‍යයනය කිරීමට අපේක්ෂිතය.

ප්‍රමුඛ පදඃ ධර්ම, ක්ෂණවාදය, අනුමානය, ප්‍රත්‍යක්ෂය, බාහිරවිෂය.

keywords : Dhamma, evanescence, inference, perception, external phenomena